THE WORLD BANK
IBRD - IDA | WORLD BANK GROUP

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

# ප්‍රසම්පාදන නිලධාරී - තනතුරු 01

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP) යනු ලෝක බැංකු (WB) මූල්‍ය ප්‍රතිපාදන යටතේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් වන අතර, එය 2024-2028 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක පුරා ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල ප්‍රවේශය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම වෙනුවෙන් සැලසුම් කර ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) ප්‍රසම්පාදන නිලධාරී තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. පළපුරුද්ද සහ සුදුසුකම් (ඇමුණුම 01), වේතනය (ඇමුණුම 02) සහ සෙසු විස්තර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2026 මාර්තු 28 දිනැති අංක 02/2026 දරන චක්‍රලේඛය මත පදනම් වේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | කාණ්ඩය (02/2026 චක්‍රලේඛයට අනුව) | සුදුසුකම් |
|---|---|---|---|
| ප්‍රසම්පාදන නිලධාරී | 01 | F කාණ්ඩය | 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ TVEC විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද, NVQ 7 මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක්<br>**සමඟ**<br>සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද.<br>**හෝ**<br>2. TVEC විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද, NVQ 6 මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක්<br>සමඟ<br>සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.<br>**හෝ**<br>3. TVEC විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද, NVQ 5 මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් සමඟ වෙනත් අවශ්‍යතා වැඩමුළු සහ පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම මෙන්ම ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු කළමනාකණය කිරීම පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසකමක් ලෙස සැලකේ.<br>සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2026, ඇමුණුම 01, vii පිටුව, F කාණ්ඩය - **"ඇමරිකානු ඩොලර් මිලියන 25ට වැඩි සහ ඇමරිකානු ඩොලර් මිලියන 200ට අඩු හෝ ඊට සමාන"** තීරුව බලන්න) |
| | | | **වේතනය** |
| | | | රු. 150,000.00 - 165,000.00 + ජීවන වියදම් දීමනාව (CoL)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2026, ඇමුණුම 02, xiii පිටුව, F කාණ්ඩය - **"ඇමරිකානු ඩොලර් මිලියන 25ට වැඩි සහ ඇමරිකානු ඩොලර් මිලියන 200ට අඩු හෝ ඊට සමාන"** තීරුව බලන්න) |

ව්‍යාපෘති විස්තර සඳහා කරුණාකර https://phsep.lk වෙත පිවිසෙන්න.

අධ්‍යාපන, පළපුරුද්ද සහ අනෙකුත් සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත්, සම්බන්ධ කර ගත හැකි දුරකථන/ෆැක්ස් අංක සහ ඊමේල් ලිපිනය ඇතුළත් සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් (නිශ්චිත ආකෘතියක් නොමැත) සහිත අයදුම්පත්, 2026 ඔක්තෝබර් 23 වන දින හෝ ඊට පෙර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**APPLICATION FOR THE POST OF PROCUREMENT OFFICER**" ලෙස සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් (පමණක්) පහත ලිපිනයට එවිය යුතුය.


**ලිපිනය:**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),**
**191 A, "බංගලාව",**
**ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය,**
**ධර්මපාල මාවත, කොළඹ 07.**

**ඊමේල් : info@phsep.lk**
**දුරකථන : 0112 271150**



SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED


**සටහන :** අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා සහ නිපුණතා සපුරා නොමැති, ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, උපකාරක ලේඛන අමුණා නොමැති සහ ලියාපදිංචි තැපැල හැර වෙනත් ක්‍රම මගින් (ඊමේල්, අතින් ගෙනවිත් දීම හෝ වෙනත් ලිපිනයකට) එවනු ලබන අයදුම්පත් සලකා බලනු නොලැබෙන අතර, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP).**
**2026 ඔක්තෝබර් 09**